# ලංකාවේ මුහුදුබඩ පළාත්වල ඇතිවූ බෞද්ධ ප්‍රබෝධය සඳහා ගණින්නාන්සේලාගේ දායකත්වය

කාන්ති ජයසිංහ[1]

ක්‍රි. ව. 16 වන සියවසේ යුරෝපා ජාතීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලන බලය අත්පත් කර ගැනීමත් සමග මෙරට මින් පෙර නොවූ විරූ අන්දමේ ජාතික හා ආගමික පරිහානියක් ඇති විය. පළමුවෙන් ම ලංකාවට පැමිණි යුරෝපා ජාතිය වූ පෘතුගීසීහු සිය යටත් විජිත රාජ්‍යය ගොඩ නැගීමට අමතරව කතෝලික ආගම ව්‍යාප්ත කිරීම සඳහා ද පියවර ගත්හ. මෙම කාර්යභාරය සාර්ථක කර ගැනීම සඳහා දේශීය පාලකයන් කතෝලික ලබ්ධි ගැන්වීම, බලයෙන් ආගමික ප්‍රචාරක කටයුතු සිදු කිරීම මෙන් ම ඊට එකඟ නෙවන්නන් විනාශ කිරිම. දේශීය ආගමික ආයතන හා පොත්පත් විනාශ කිරිම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කෙරිණ.

උඩරට රාජධානිය යටත් කර ගැනීම සඳහා නිරන්තර යුද්ධ මාලාවක නිරත වු පෘතුගීසීන්ගෙන් සිය රාජ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩිපුර කාලයක් මිඩංගු කිරිමට උඩරට පාලකයාට ද සිදුවිය. එම තත්ත්වය යටතේ බුදුසසුන ආරක්ෂාව කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කිරිමට ඔහුට නොහැකිවිය. එහෙයින් මෙකී කාලසීමාව තුළ මුහුදුබඩ පළාත්වල භික්ෂුන් වහන්සේලාට මෙන්ම බෞද්ධ ජනතාවට ද ඉතා දුක්ඛිත තත්ත්වයකට මුහුණදීමට සිදුවිය. ලන්දේසී පාලනය යටතේ ද මුහුදුබඩ පළාත්වල බුදුසසුන සහ දේශීය අධ්‍යාපනික කටයුතු අවුල් සහගත තත්ත්වයට පත්විය. ඔවුහු දේවස්ථාන මගින් පමණක් නොව පාසල් මගින් ද සිය ආගම ප්‍රචාරය කිරිම සඳහා අවශ්‍ය පියවර ගත්හ.

මෙම තත්ත්වය යටතේ ක්‍රි.ව 16වන සියවසේ සිට 18 වන සියවස අවසාන භාගය දක්වා කාල පරිච්ඡේදය තුළ මුහුදුබඩ ප්‍රදේශවල භික්ෂුන් වහන්සේලා මෙන්ම බෞද්ධ ජනතාව ද දැඩි පීඩනයකට හසු වූහ. එම පසුතලය තුළ තම භික්ෂු ජීවිතය ගත කිරීමට අපහසු වූ බැවින් ඇතැම් භික්ෂූන් වහන්සේලා සිවුරු හැර ගියහ. එහෙත් බුදු සසුන කෙරෙහි මහත් ශ්‍රද්ධා භක්තියෙන් කටයුතු කළ භික්ෂූන් වහන්සේලා බෞද්ධ පොත් පත් හා පූජා භාණ්ඩ මෙන් ම වත් පිළිවෙත් ආදිය ආරක්ෂා කර ගැනීම සඳහා වෙස්වලා ගෙන නොයෙක් තැන්වල සැඟවුණාහ. මෙසේ සැඟවී සිට බුදුසසුන රැකගැනීමට සේවය කළ පිරිස ගණින්නාන්සේලා ලෙස හැඳින්වූහ.

මෙසේ බුදු සසුන නගා සිටුවමින් බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා ගණින්නාන්සේලා නිරන්තරයෙන් ඇප කැප වුව ද උන් වහන්සේලා පිළිබඳ නිවැරදි වැටහීමක් සමාජය තුළ නොමැති බව මූලාශ්‍රයන්හි ඔවුන් සම්බන්ධව දක්වා ඇති තොරතුරුවලින් පැහැදිළි වේ. බොහෝ මූලාශ්‍රවල ගණින්නාන්සේලා හඳුන්වා ඇත්තේ ආගමික පරිහානියට ඉවහල් වූ දුස්සීල පිරිසක් වශයෙනි. එබැවින් ගණින්නාන්සේලා පිළිබඳව නිවැරදි අවබෝධයක් සමාජගත කිරීම මෙන්ම ඔවුන්ගේ සේවාව පරීක්ෂා කිරීම කෙරෙහි මෙම පර්යේෂණය මගින් අවධානය යොමු කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ගණින්නාන්සේලා, බෞද්ධ ප්‍රබෝධය, මුහුදුබඩ පළාත්. පෘතුගීසි, ලන්දේසි

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය, මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
Email: jkajayasinghe@yahoo.com